# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

## ප්‍රාසංගික කලාවේදී (ගෞරව) උපාධි පළමුවන වසර පරීක්ෂණය - 2020/2021

## නර්තන හා නාට්‍ය කලා පීඨය

## කලාවේ දර්ශනය සහ සෞන්දර්ය සංකල්ප

## DDCT 11012

කාලය :- පැ 03

❖ සැ.යු :- පිළිතුරු ලිවීම ආරම්භ කිරීමට පෙර දී ඇති උපදෙස් හොඳින් කියවන්න.

---

❖ මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් (02) සහ ප්‍රශ්න දහයකින් (10) සමන්විත ය.
❖ එක් කොටසකින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් හෝ තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.
❖ එක් එක් කොටස සඳහා පිළිතුරු සැපයීමේදී පිළිතුරු ලියන පොත් වෙන වෙනම භාවිත කළ යුතුය.
❖ සෑම ප්‍රශ්නයක් සඳහාම පිළිතුරු අලුත් පිටුවකින් ආරම්භ කරන්න.
❖ සියලුම ප්‍රශ්න සඳහා සමාන ලකුණු ලැබේ.

---

### I කොටස

01. කලාව සහ සෞන්දර්යය යන සංකල්ප එකිනෙකට වෙනස් වන්නේ කෙසේදැයි විමර්ශනාත්මකව පැහැදිලි කරන්න.

02. නිර්මාණකරුගේ අත්දැකීම් හා පරිකල්පන පරාසය කලා නිර්මාණයක් බිහිකිරීමෙහිලා වැදගත් වන්නේ කෙසේදැයි නිදසුන් සහිත ව විමසන්න.

03. සහකම්පනය (Empathy) පැහැදිලි කර සහකම්පනීයවීම කලාකරුවකුට වැදගත්වන්නේ ඇයිදැයි විස්තර කරන්න.

04. අත්දැකීම් සහ පරිකල්පනය සංජානන ක්‍රියාවලියට බලපාන අයුරු විමසන්න.

05. දේශීය නර්තන කලා භාවිතයන් හි භරතමුනි රස සංකල්පය ප්‍රතිබිම්බනය වන අයුරු පැහැදිලි කරන්න.

06. අජීවී වෙස්මුහුණ රස ජනනය කරන අභිවාහකයෙක් ලෙස හඳුනාගත හැකිදැයි සහේතුකව පැහැදිලි කරන්න.

### II කොටස

07. අත්දැකීම් තීව්‍ර කිරීම (Intensification) සහ පැහැදිලි කිරීම (Clarification) සඳහා වූ කලාවේ ශක්‍යතාව සමාජමය වශයෙන් වැදගත් වන්නේ ඇයිදැයි විමසන්න.

08. අර්වින් එඩ්මන්ගේ (Irwin Edman) "වියවුලට පිළිවෙලක් ලබාදීම" (Giving an order to the chaos) සහ ඉමැනුවෙල් කාන්ට් (Immanuel Kant) ගේ "නිර්උපයෝගී ගුණය" (Non-Utilitarian) යන සංකල්ප ඔස්සේ කලාවේ කාර්යය සහ අගය පිළිබඳ සාකච්ඡා කරන්න.

09. "කලාවට අප දක්වන ප්‍රතික්‍රියාව සැබෑ ජීවියතට දක්වන ප්‍රතික්‍රියාවම නොවේ." මෙම ප්‍රකාශය සමඟ ඔබේ එකඟතාව හෝ නොඑකඟතාව පැහැදිලි කරන්න.

10. කලාකෘතියක් විචාරය කිරීමේදී විචාරකයා සතු විය යුතු විචාර දුරස්ථභාවය (critical distance) පැහැදිලි කරන්න.

......................

2023.07.10